## ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරීන් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු වලට පත් කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය - 2025

**1. ජ්‍යෙෂ්ඨතාවය** — උපරිම ලකුණු 50

(ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස් වූ දින සිට වසරකට ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව I ශ්‍රේණියේ වැඩිම සේවා කාලය සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස I ශ්‍රේණියේ සේවා කාලය සඳහා ද ලකුණු හිමි වන පරිදි ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ)

සටහන : ශ්‍රී ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ වසර දෙක (02) ක සේවා කාලයක් සහිතව II හා III වල ශ්‍රේණි වල වසර 12කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන්ගේ, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර දෙක ට වඩා වූ අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලය ද I ශ්‍රේණියේ සේවා කාලයක් සේ සලකා ලකුණු ලබා දෙනු ලැබේ.

**2. අතිරේක අධ්‍යාපන සුදුසුකම්** — උපරිම ලකුණු 15

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ

(බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා හෝ ශ්‍රේණි උසස්වීම් සඳහා හෝ මූලික සුදුසුකමක් ලෙස අදාල කරගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ)

| | |
|---|---|
| 2.1 දර්ශනශූරි (PhD) | - ලකුණු 15 |
| 2.2 දර්ශනපති (M Phil) | - ලකුණු 13 |
| 2.3 පශ්චාත් උපාධිය | - ලකුණු 11 |
| 2.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 09 |
| 2.5 මූලික උපාධිය | - ලකුණු 07 |
| 2.6 අධ්‍යාපන ක්ෂේත්‍රයට / බඳවාගත් විෂය ක්ෂේත්‍රයට අදාළව හදාරණ ලද ඩිප්ලෝමා | - ලකුණු 05 |
| 2.7 වෙනත් ඩිප්ලෝමා | - ලකුණු 03 |

(උක්ත 2.6 හා 2.7 යටතේ ලකුණු ලබා දීමේ දී අදාළ ඩිප්ලෝමාවේ අධ්‍යයන කාලසීමාව අවම වශයෙන් පැය 450ක් හෝ මාස 9කට හෝ වැඩි විය යුතු අතර ඩිප්ලෝමාව ප්‍රදානය කරන ආයතනය රජයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් විය යුතුය)

**3. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන** — උපරිම ලකුණු 10

3.1 පර්යේෂණ

i. තනි පුද්ගල පර්යේෂණ වාර්තා - ලකුණු 05 × 2

ii. කණ්ඩායම් පර්යේෂණ වාර්තා - ලකුණු 03 × 2

(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium ) ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද උපරිම පර්යේෂණ වාර්තා 02ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)

3.2 පොත් හා ප්‍රකාශන - ලකුණු 05 × 2

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරිත්වයක් දරණ පොත් හා ප්‍රකාශන උපරිම 02 සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)



CamScanner

3.3 අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ලිපි / වාර්තා - ලකුණු 02 × 5

(ශාස්ත්‍රීය සංග්‍රහ, සඟරා සහ වාර ප්‍රකාශන, පුවත්පත්වල පළ කරන ලද තනි පුද්ගල ප්‍රවෘත්තිමය ස්වරූපයේ නොවන අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් කරුණකට අදාළ ශාස්ත්‍රීය ලිපි හෝ වාර්තා සඳහා පමණක් (අවම වචන ප්‍රමාණය 750 ක් විය යුතුය) ලකුණු ලබා දෙනු ලැබේ. (එකකට ලකුණු 02 බැගින් උපරිම 05ක් සඳහා)

4. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම — උපරිම ලකුණු 05

(ප්‍රායෝගික භාවිතය පිළිබඳව සළකා බලනු ලැබේ. මෙහිදී අනු අංක 6 යටතේ සඳහන් කර ඇති පරිදි පරිගණකය භාවිතයෙන් Power Point ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව office package ආශ්‍රයෙන් වෙනත් කාර්යයක් වුවද පරිගණකය භාවිතයෙන් සිදුකිරීමේ හැකියාව මැන බලනු ඇත)

5. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය — උපරිම ලකුණු 05

(සන්නිවේදන කුසලතාවය සළකා බලනු ලැබේ. මෙහිදී කථන හැකියාව, කියවා යමක් අවබෝධ කරගෙන අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීමේ හැකියාව, ප්‍රශ්නවලට පිළිතුරු දීමේ හැකියාව මැන බලනු ඇත)

6. ඉදිරිපත් කිරීම — උපරිම ලකුණු 10

සේවා ස්ථානයේ, (අධ්‍යාපන අමාත්‍යාංශය / ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව / පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය / කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය / පාසල) රාජකාරි ඉටු කිරීමේදී, අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ කරුණක් / අවස්ථාවක් / වැඩසටහනක් / ව්‍යාපෘතියක් පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

i. ප්‍රවේශය හා හැඳින්වීම - ලකුණු 2
ii. අන්තර්ගතය - ලකුණු 4
iii. ඉදිරිපත් කිරීමේ කුසලතාවය - ලකුණු 2
iv. කාල කලමනාකරණය - ලකුණු 2

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර සිදු කරනු ලබන ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.

7. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලැබූ සමස්ථ කුසලතාව — උපරිම ලකුණු 05

**100**

